ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1986 අංක 7 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1986 අංක 7 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1986 මාර්තු මස 20 වන දින.]

**එල්. ඩී.—ඕ 17/84**

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 7 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් ඡේදග ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1971 අංක 46 දරන පනතේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.**

" (ඒඒ) ජාතික ආර්ථිකයේ යහපත පිණිස අවශ්‍යයයි අමාත්‍ය වරයා විසින් සලකනු ලබන කාලසීමාවක් සඳහා—

(i) තැඹිලි හැර, කුරුම්බා කිසිවක් යම් මහ නගර සභාවක හෝ නගර සභාවක හෝ පරිපාලන සීමා ඇතුළත ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නැතහොත් ප්‍රදර්ශනය කර තැබීම ;

(ii) කිසිදු පොල් ගසකින් පොල් මල් හෝ ගොක්කොළ හෝ කැපීම, ඒවාට හානිකිරීම, ඒවා විකෘති කිරීම හෝ විනාශ කිරීම ;

(iii) යම් ප්‍රදේශයක පොල් ගස්, වාණිජ කාර්ය සඳහා මැදීමට අවසර දෙමින් සුරා බදු කොමසාරිස් වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, ඒ ප්‍රදේශය හැර වෙනත් කවර වුව ද ප්‍රදේශයක යම් පොල් ගසක් වාණිජ කාර්ය සඳහා මැදීම ;

(iv) යම් පරිපාලන දිස්ත්‍රික්කයක පිහිටි රජයේ ඉඩමක් නොවන යම් ඉඩමක වූ යම් පොල් ගසක් කපා හෙලීම, කප්පාදු කිරීම හෝ මැරීම ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා හෝ ඔහුගේ අධිකාරය යටතේ ක්‍රියා කරන වෙනත් යම් නිලධරයකු හෝ විසින් ලියවිල්ලකින් බලය දී ඇත්නම් මිස, කිසිදු පරිපාලන දිස්ත්‍රික්කයක පිහිටි රජයේ ඉඩමක් නොවන ඉඩමක වූ පොල් ගසක් කපා හෙලීම, කප්පාදු කිරීම හෝ මැරීම නැතහොත් කපා හෙලීමට, කප්පාදු කිරීමට හෝ මැරීමට අවසර දීම හෝ සැලැස්වීම

තහනම් කිරීම ; ".